# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,516—1958 සැප්තැම්බර් 5 වැනි සිකුරාදා—5.9.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස—අධිකරණ

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ මෙත වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — | පිස්කල් විකිණීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 403 | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| වස්තුභංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට දකුණු දිසාව සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1958ක්වූ සැප්තැම්බර් මස 15 වන දින පෙරවරු 11ට ගාල්ලේ ශ්‍රේෂ්ඨ අධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දනුම් දෙමි.

පිස්කල්.

වර්ෂ 1958ක්වූ අගෝස්තු මස 25 වන දින,
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේ දීය.

### ප්‍රකාශ පත්‍රයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු කටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥවක බලය කරණකොට ගෙණ මෙයින් ප්‍රකාශකරන්නේ නම් යාපනය, මන්නාරම, වව්නියා-මුල්ලතිව් දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය වර්ෂ 1958ක්වූ සැපතැම්බර් මස 15 වෙනි දින පෙරවරු 11 පැය පටන් යාපනය නගරශාලාවේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එහි යම් කාරණා ඇතුව සිටින සැම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුළුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

එම්. ශ්‍රී කාන්තා,
උතුරු පළාතේ පිස්කල් වම්හ.

වර්ෂ 1958ක්වූ අගෝස්තු මස 26 දින,
යාපනය පිස්කල් කන්තෝරුවේදීය.

## විශේෂ නිවේදනයයි

**1958 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් බැවින්, සැප්තැම්බර් මස හතර වැනි සතියේ ගැසට් පත්‍රය 1958 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරනු ලැබේ. ඒ හෙයින් එහි පළකිරීම සඳහා එවන නිවේදන සහ දැන්වීම් සැප්තැම්බර් මස 22 වැනි සඳුද පස්වරු 4 ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතු බව කාගේත් දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.**

**1958 සැප්තැම්බර් 2 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සැම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශණ සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශණයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශණ, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශණයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සැම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... ... | 120 | 0 |

අඟලේ සැම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සැම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරණ දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරණ දින සිට කාර්යාලය වැඩ කරණ දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශණයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශණ කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා | 15 | 0 |
| | 1වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සැම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| 1 වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේනම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශණ කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී